GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/09/14

## මාධ්‍ය නිවේදනයයි

වෛද්‍ය සේවා සැපයීමේදී ගුණාත්මකභාවය මෙන්ම එය සැමට සමසේ රට පුරා බෙදාදීමට සැලසීම අවශ්‍ය කාරණයකි. ලෝකයේ ඉතාමත් අරපිරිමැස්මෙන් සෞඛ්‍ය සේවා සලසන හොඳම රට ලෙස ශ්‍රී ලංකාව කීර්තියක් දිනා ඇත්තේ වෛද්‍යවරු රටපුරා එක සමානව සේවා සලසන බැවිනි. එයට දායක වන ප්‍රධානම හේතුව වන්නේ වසර 04කට වරක් සිදුවන වෛද්‍යවරුන්ගේ මාරුවීමේ ප්‍රතිපත්තියයි.

මෙම මාරුවීම් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කර රටපුරා රෝගී සේවාව ආරක්ෂා කිරීම සිදු විය යුතු වුවද, අසාධාරණ අයුරින් එය බිඳ වැටීමට සිදු විය. ඊට ප්‍රධාන හේතුව වූයේ සෞඛ්‍ය අමාත්‍යාංශය පරිඝණක භාවිතයකින් තොරව සහ වෛද්‍ය දත්ත ගබඩාවකින් තොරව කටයුතු කිරීමයි.

එබැවින් අප වෛද්‍ය සංගමය පහත යෝජනා 02 ඉදිරිපත් කරන ලදී.

1. වෛද්‍යවරුන්ගේ පරිඝණක ගත දත්ත ගබඩාවක් සැකසීම.
2. වෛද්‍යවරුන්ගේ මාරුවීම් අන්තර්ජාලය මගින් ඉදිරිපත් කිරීම.

මෙම ක්‍රියාවලියට අමාත්‍යතුමා, ලේකම්තුමා ඇතුලු සම්පූර්ණ අමාත්‍යාංශය සහයෝගය ලබා දුන්නද බොහෝ රෝහල් අධ්‍යක්ෂවරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පැහැර හරින බව දක්නට ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පැහැර හරින රෝහල් අධ්‍යක්ෂකවරුන්ට විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු බව අප අවධාරණය කරන්නේ රෝගීන්ගේ සුභ සිද්ධිය වෙනුවෙනි.

එසේ නමුත් ජාතික රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා ඔහුගේ කැපවීම සියලුම දත්ත කාර්යක්ෂමව ලබා දෙමින් පෙන්වා දි ඇත. අනෙකුත් රෝහල් වල අධ්‍යක්ෂකවරුන්ටද ලබා දුන් මේ ආදර්ශය අගය කරමු. ලංකාවේ විශාලම රෝහල වූ ජාතික රෝහල මාරුවීම් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කරද්දී ඊට වඩා කුඩා රෝහල්වලට එය කල නොහැකි වන්නේ අසතුටුදායක ආකල්ප නිසා බව අපි අවධාරණය කරමු.

ස්තූතියි,

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර -

වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516